# මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2016

## Primary Piriven Mid -Year Term Test - 2016

### 05 වසර / Grade 05

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**පාලි - i** | කාලය : පැය තුන යි
**PALI - i** | Time : Three Hours

**I** කොටසේ **සියලු ම** ප්‍රශ්නවලට ද, **II** කොටසේ **දෙවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

---

**I කොටස**

1. පහත දැක්වෙන සියලු ම ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

   I. පාලි භාෂාවේ ඇති ඝෝෂාක්ෂර සියල්ල ලියා දක්වන්න.
   II. ගුණවා, ලතායං, ඵලස්ස, භික්ඛු යන වචනවල ලිංග, විභක්ති හා වචන නම් කරන්න.
   III. පාලි භාෂාවේ ඇති කණ්ඨජාක්ෂර හා කණ්ඨතාලුජාක්ෂර වෙන වෙන ම ලියා දක්වන්න.
   IV. 'වමොදුදන්තානං' යන සූත්‍රය මගින් කෙරෙන සන්ධි කාර්ය හඳුන්වා උදාහරණ **දෙකක්** දක්වන්න.
   V. 'තණ්හා + ඛයො' යන පදය සූත්‍රානුසාරයෙන් සන්ධි කරන්න.
   VI. මාතාපිතරො, තිලොකං, කුම්භකාරො, උපනගරං යන පද කවර සමාස ප්‍රවර්ගයකට අයත් දැයි නම් කරන්න.
   VII. උපසර්ග පද **අටක්** ලියා දක්වන්න.
   VIII. 'භික්ඛු' ශබ්දයෙහි සත්තමී විභක්ති රූප **හතර** ලියා දක්වන්න.
   IX. **පටපටගායි, ශබ්දකරයි** යන අරුත් දෙන පාලි වචන ලියා දක්වන්න.
   X. පූර්වක්‍රියා පද නිර්මාණය කර ගැනීමේ දී භාවිත වන ප්‍රත්‍යය **දෙකක්** දක්වා, ඒවාට උදාහරණය බැගින් ලියන්න.

*(ලකුණු 4 × 10 = 40 යි)*

**II කොටස**

2. (I) පහත දැක්වෙන ගද්‍ය පාඨය සිංහලයට නගන්න.

අථ ඛො භික්ඛවෙ, කාළිදාසී දිවා උට්ඨාසි. අථ ඛො භික්ඛවෙ වෙදෙහිකා ගහපතානී කාළිං දාසිං එතදවොච. හෙ ජෙ කාළීති. කිං අය්‍යෙති. කිං ජෙ දිවා උට්ඨාසීති. න ඛො අය්‍යෙ කිඤ්චීති. නො වත රෙ කිඤ්චි පාපී දාසි දිවා උට්ඨාසීති කුපිතා අනත්තමනා භකුටිං අකාසි. අථ ඛො කාළියා දාසියා එතදහොසි. සන්තං යෙව ඛො මෙ අය්‍යා අජ්ඣත්තං කොපං න පාතුකරොති නො අසන්තං. මය්හමෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං කොපං නො පාතුකරොති නො අසන්තං. යන්නූනාහං භිය්‍යොසොමත්තාය අය්‍යං වීමංසෙය්‍යන්ති.

**නැතහොත්**

පහත සඳහන් පද්‍ය පාඨ සිංහලයට නගන්න

ගම්භීරං නිපුණං ධම්මං - සුණිත්වා විමලං වරං,
සොතාපත්තිඵලං පත්වා - සහස්සනයමණ්ඩිතං.

නිමන්තෙත්වාන සම්බුද්ධං - සසංඝං ලොකනායකං,
වණ්ණගන්ධරසූපෙතං - දත්වා දානං සුඛාවහං.

සත්‍ථු ආගමනත්‍ථාය - සාවත්‍ථිනගරං වරං,
පටිඤ්ඤං සො ගහෙත්වාන - ගච්ඡන්තො අන්තරාපථෙ.

යොජනෙ යොජනෙ චාරු - චිත්තකම්මසමුජ්ජලෙ,
විහාරෙ පවරෙ දත්වා - කාරාපෙත්වා බහුං ධනං.

*(ලකුණු 07 යි)*

(II) පහත දැක්වෙන **එක් මාතෘකාවක්** තෝරාගෙන වචන **25කට** නො අඩු පාලි රචනාවක් ලියන්න.

(අ) වෙසාඛපුණ්ණමී දිවසො
(ආ) මමාචරියත්ථෙරො

**නැතහොත්**

පහත දැක්වෙන වාක්‍ය පාලි භාෂාවට පරිවර්තනය කරන්න.

(අ) යම් දිනයක මම මෙම රටෙහි ධර්මධර, විනයධර මහතෙරුන් වහන්සේ නමක් වන්නෙමි.
(ආ) පෙර ලංකාවේ කාවන්තිස්ස නම් රජතුමෙක් වීලු.
(ඉ) නුඹ ධර්මය අසා සත්පුරුෂයෙක් වන්න.
(ඊ) වහාම අපි රථයෙන් නගරයට ගොස් උත්සවය බලමු.

*(ලකුණු 08 යි)*

**3.** (i) **අත්ත** ශබ්දය (පුල්ලිංග) හෝ **මාතු** ශබ්දය (ඉත්ථිලිංග) හෝ සියලු විභක්තිවල වරනගන්න.
**(වරනැගීම් වගුව අවශ්‍යයි)**

*(ලකුණු 09 යි)*

(ii) (අ) සක්ක, ආසන (ආ) සුරාගණ්ඩ, කණ්හසප්ප (ඉ) එක, සිගාල යන පද අර්ථවත් ලෙස සකස් කොට පිළිවෙළින් යොදා පහත සඳහන් වාක්‍යවල හිස්තැන් පුරවා නැවත ලියන්න.

(ආ) තස්මිං ඛණෙ ......................... ......................... උණ්හාකාරං දස්සෙසි.
(ඉ) අථ ........................ අඤ්ඤතරස්මා රුක්ඛසුසිරා ........................ නික්ඛමිත්වා රඤ්ඤො අභිමුඛො ආගච්ඡති.
(ඊ) තතො .......................... සුචි ආගම්ම .......................... අක්ඛිං භින්දි.

*(ලකුණු 06 යි)*

4. (i) නිග්ගහීත සන්ධිය හඳුන්වා, එහිදී භාවිත වන සන්ධි කාර්ය තුනක් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

*(ලකුණු 07 යි)*

(ii) පහත සඳහන් බාලාවතාර සූත්‍රවලින් සිදුවන සන්ධි කාර්ය හඳුන්වා ඒවාට උදාහරණය බැගින් ලියන්න.

(අ) ලොපඤ්ච තත්‍රාකාරො
(ආ) යවමදනතරළාචාගමා
(ඉ) පරද්වෙභාවො ඨානෙ
(ඊ) පරො වා සරො

*(ලකුණු 08 යි)*

5. (i) කම්මධාරය සමාසය හඳුන්වා, එහි ප්‍රභේද සියල්ල නම් කොට, ඒවාට උදාහරණය බැගින් සපයන්න.

*(ලකුණු 09 යි)*

(ii) ද්වන්ද සමාසය විස්තර කොට එහි ප්‍රභේද උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

*(ලකුණු 06 යි)*

6. (i) පඤ්චමී හා චතුත්ථී විභක්ති යෙදෙන අර්ථ **දෙක** බැගින් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

*(ලකුණු 08 යි)*

(ii) සන්ධි, සමාස, තද්ධිත අතර වෙනස සෝදාහරණව පැහැදිලි කරන්න.

*(ලකුණු 07 යි)*

7. (i) සන්ධි කාර්ය **හයක්** උදාහරණ දක්වමින් පැහැදන්න.

*(ලකුණු 09 යි)*

(ii) නිපාත පද **හයක්** අර්ථ සහිතව ලියා දක්වන්න.

*(ලකුණු 06 යි)*

***

# මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2016

## Primary Piriven Mid-Year Term Test - 2016

05 වසර / Grade 05

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

**පාලි - ii** කාලය : පැය තුන යි

**PALI - ii** Time : Three Hours

**I, II** කොටස්වල ප්‍රශ්න **සියල්ලට ම** ද, **III** කොටසින් ප්‍රශ්න **එකක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**I කොටස**

1. පහත දැක්වෙන (i) සිට (x) තෙක් සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- පහත සඳහන් වාක්‍යවල හිස්තැන්වලට සුදුසු පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවා වාක්‍ය නැවත ලියන්න.

(i) (අ) ධම්මපදට්ඨකථාවෙහි ඇතුළත් කථා ගණන ....................................... (299/300/423) කි.

(ආ) ''අක්කොච්ඡි මං'' යනාදි ගාථාවන්ට අදාළ නිදාන කථාව වන්නේ ....................................... (චුල්ලතිස්සත්ථෙර/චක්ඛුපාලත්ථෙර/කෝසම්බක) වත්ථුව ය.

(ii) (අ) ''කුට ජටිල ! අරඤ්ඤතො ආගන්ත්වා මම ජටාසු අක්කමති'' යන මෙම පාඨය උපුටා ගෙන ඇත්තේ ...................................... (චුල්ලතිස්සත්ථෙර/කාලියක්ඛිනි) වත්ථුවෙනි.

(ආ) ධම්මපදට්ඨකථාව ලිවීමට ආරාධනා කරන ලද්දේ .................................. (වනරතන/ රතනජෝති/ කුමාරකස්සප) හිමියන් විසිනි.

(iii) (අ) දාඨාවංසයෙහි පරිච්ඡේද ගණන ....................................... (7/8/5) කි.

(අ) දාඨාවංසය රචනා කෙරුණේ ....................................... (ධර්මකීර්ති/බුද්ධඝෝෂ/වනරතන මේධංකර) හිමියන් විසිනි.

(iv) (අ) බුදුරදුන් රුවන් ගෙයි වැඩ විසුවේ බුද්ධත්වයෙන් .......................................(තෙවන/ දෙවන/ සතරවන) සතියේ දීය.

(ආ) බුදුරදුන්ගේ වම් දළදාව චිතකයෙන් ගනු ලැබුයේ ....................................... (මහාකාශ්‍යප/ ආනන්ද/ඛේම) හිමි විසිනි.

(v) (අ) අභිනව සාසනවංසය රචනා කළේ.......................... (රතනජෝති/පියතිස්ස/සිරිරතන) නම් හිමි නමකි.

(ආ) අභිනව සාසනවංසයෙහි පළමු ධර්ම සංගායනාව පිළිබඳ සඳහන් වන්නේ............................... (1/2/3) පරිච්ඡේදයෙහි ය.

*(ලකුණු 20 යි)*

- පහත සඳහන් පාලි පාඨ සිංහලයට නගන්න.

(vi) අථ බ්‍රාහ්මණො කතභත්තකිච්චං තථාගතං උපසඞ්කමිත්වා නීචාසනෙ නිසින්නො පඤ්හං පුච්ඡි.

(vii) තත්‍ථ අක්කොච්ඡී'ති අක්කොසි, අවධි'ති පහරි.

(viii) ලභිංසු අන්ධා විමලෙ විලොචනෙ,
සුණිංසු සද්දෙ බධිරාපි ජාතියා,
ලපිංසු මූගා වචනෙන වග්ගුනා,
චරිංසු ඛෙලං පදසාව පඞ්ගුලා.

(ix) කත්වාන අට්ඨ කොට්ඨාසෙ භාජෙත්වා සෙස ධාතුයො,
අදාසි අට්ඨ රාජූනං තං තං නගරවාසිනං.

(x) ලංකාදීපං පුනාගන්ත්වා පරිසාය සකාය සො,
පතිට්ඨාපෙසි ලංකායං මරම්මවංසං යතිස්සරො. *(ලකුණු 20 යි)*

## II කොටස

2. (i) සිංහලයට පරිවර්තනය කරන්න.

අයං මාණවො මයි මනං පසාදෙත්වා තාවතිංසදෙවලොකෙ තිංසයොජනිකෙ කනකවිමානෙ නිබ්බත්තිස්සති, අච්ඡරාසහස්සමස්ස පරිවාරො භවිස්සති, බ්‍රාහ්මණො’පි නං ඣාපෙත්වා රොදන්තො ආළාහනෙ විචරිස්සති, දෙවපුත්තො තිගාවුතප්පමාණං සට්ඨිසකටභාරාලංකාරපතිමණ්ඩිතං අච්ඡරාසහස්සපරිවාරං අත්තභාවං ඔලොකෙත්වා “කෙන නු ඛො කම්මෙන මයා අයං සිරිසම්පත්ති ලද්ධා’ති ඔලොකෙන්තො මයි චිත්තප්පසාදෙන ලද්ධභාවං ඤත්වා ධනච්ඡෙදභයෙන මම පිතා භෙසජ්ජං අකත්වා ඉදානි ආළාහණං ගන්ත්වා රොදති, විප්පකාරප්පත්තං නං කරිස්සාමී’ති පිතරි අක්ඛන්තියා මට්ටකුණ්ඩලී වණ්ණෙනාගන්ත්වා ආළාහණස්සාවිදූරෙ නිපජ්ජිත්වා රොදිස්සති.

*(ලකුණු 10 යි)*

(ii) ප්‍රසන්න වූ මනසින් කරන ක්‍රියාවේ අනුසස් ධම්මපදට්ඨකථාවේ මට්ඨකුණ්ඩලීවත්‍ථුව ඇසුරින් පැහැදිලි කරන්න.

*(ලකුණු 05 යි)*

3. (i) සිංහලයට නගන්න.

අනෙකසංඛං ධනධඤ්ඤසම්පදං,
පතිට්ඨපෙත්වා කපණෙසු දුච්චජං,
අනප්පකෙ පෙමභරානුබන්ධිනො,
විහාය මිත්තෙ ච සුතෙ ච බන්ධවෙ.

පහාය කාමෙ නිඛිලෙ මනොරමෙ,
සරාභිනික්ඛම්ම හිමාචලන්තිකෙ,
මහීධරං ධම්මිකනාමවිස්සුතං,
උපෙච්ච නානාතරුරාජි භූසිතං.

*(ලකුණු 5 × 2 = 10 යි)*

(ii) දාඨාවංස කෘතියෙන් හෙළිවන සුමේධ බෝසත් චරිතය ගෙනහැර දක්වන්න.

*(ලකුණු 05 යි)*

4. (i) සිංහලයට නගන්න.

ඉත්‍ථං මුනින්දපවරෙ පරිනිබ්බුතස්මිං,
ථෙරො තතො තතියසාවකතං සුපත්තො,
යො තස්ස කස්සපමහායතිකුඤ්ජරො සො,
ඛීණාසවෙහි සහ පඤ්චසතෙහි ධීරො.

වෙභාරපබ්බතගුහාය හි සත්තපණ්ණි,
නාමාය භූමිපතිනා මගධාධිපෙන,
කාරාපිතෙ පඨමමුත්තමමණ්ඩපස්මිං,
සංගායි ධම්මමතුලං සුගතස්ස තත්‍ථ. *(ලකුණු 5 × 2 = 10 යි)*

(ii) පළමු වන ධර්ම සංගායනාව පිළිබඳ අභිනව සාසනවංසයෙන් හෙළිවන තොරතුරු සාකච්ඡා කරන්න.

*(ලකුණු 05 යි)*

## III කොටස

5. කර්මය සත්වයා පසුපස ගමන් කරමින් ඵලවිපාක දෙන අයුරු ධම්මපදට්ඨකථාවේ මුල් කථා දෙක උපයෝගි කර ගනිමින් පහදන්න.

*(ලකුණු 15 යි)*

6. “දාඨාවංස කෘතිය රමණීය කාව්‍යයකි” මෙම කියමන පිළිබඳ ඇගයීමක් කරන්න. *(ලකුණු 15 යි)*

***